# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX | YEAR OF OUR LORD JESUS CHRIST, 2025 FEBRUARY | Issue No. 03


## ශුද්ධවූ බයිබලය

### (හිතෝපදේශය 21:22-31)

22. ප්‍රඥාවත්තෙම බලවතුන්ගේ නුවරට නැගී, ඔවුන් විශ්වාසකරන බලය හෙළා දමන්නේය.

23. කටවල්කරගන්නා තමාගේ ප්‍රාණය විපත්තිවලින් රැකගන්නේය.

24. උඩඟුරැ අහංකාර අයගේ නම නින්දාකරන්නාය, ඔහු අහංකාර මානයෙන් ක්‍රියාකරන්නේය.

25. අලසයාගේ ආශාව ඔහු මරයි; මක්නිසාද ඔහුගේ අත් වැඩකරන්ට අකැමතිය.

26. දවස මුළුරැල්ලේ ගිජුලෙස ආශාවන්නෙක් ඇත; එහෙත් ධර්මිෂ්ඨයා නොවලක්වා දෙන්නේය.

27. දුෂ්ටයාගේ පූජාව පිළිකුලක්ය; ඔහු එය ප්‍රයෝග සිතින් ගෙනෙන විට කොපමණ වැඩියෙන් එසේ නොවන්නේද?

28. බොරු සාක්ෂිකාරයා විනාශවන්නේය; එහෙත් ඇහුම්කන්දෙන්නා අවහිරයක් නැතුව කථාකරන්නේය.

29. දුෂ්ටයා තමාගේ මුහුණ දැඩිකරගනියි; එහෙත් අවංක තැනැත්තා තමාගේ මාර්ගය කල්පනාකර බලයි.

30. ස්වාමීන්වහන්සේට විරුද්ධව ප්‍රඥාවක්වත් නුවණක්වත් මන්ත්‍රණයක්වත් නැත.

31. අශ්වයා යුද්ධ දවසට සැදී සිටියි; එහෙත් ජය පැමිණෙන්නේ ස්වාමීන්වහන්සේගෙන්ය.

# ජයග්‍රහණය පිණිස දුවමු

Run to Win!

(ප්‍රධාන කර්තෘ දේවගැති ඒන්ජලින් සෙල්වකුමාරි)



1986 වන වර්ෂයේදී ආසියානු ක්‍රීඩා උළෙල සියොල් නුවරේදී පැවැත්වූ අතර මීටර් 800 ධාවන තරගයේ අවසාන තරගයගයද එහිදී පැවැත්විණි. ඉන්දියාවේ ඉතා ප්‍රබල ධාවන ශූරියෙක් වන ශයිනි ඒබ්‍රහම් ඒ තරගයේදී රන්පදක්කම දිනා ගනී කියා ඉන්දියානුවන් හැමෝම බලාපොරොත්තු විය.

ෂයිනි අවසාන දිනුම කරා පැමිණි විට ඉන්දියානුවන් සෑම කෙනෙකුගේම හදවත තුළ තිබූ ප්‍රීතිය වචනවලින් කියා නිම කළ නොහැකි විය.

මුළු රටම ප්‍රීති ඝෝෂා හඬ නැන්වූවෝය. නමුත් ඒ ප්‍රීතිය සුළු මොහොතකින් සුන් වී ගියේය. මන්ද ශයිනිගේ දිනුම ප්‍රතික්ෂේප විය. එයට හේතු වූයේ ඇය ඇගේ ධාවන පථයෙන් පිටත ධාවනය කළ නිසාය.

ින්ගේම

ඇය ඉතාම වෙහෙස මහන්සි වී මේ තරගය සඳහා පුහුණුව ලැබීය. නමුත් ඇයට ඒ සුදුසුකම ලැබුණේ නැත. සෑම ඉන්දියානුවෙක්ම ඇයව විශ්වාස කළෝය. නමුත් එය නිශ්ඵල විය. මා මේ සම්බන්ධව සිතන සෑම මොහොතේදීම මා ශයිනි ගැන දුක් වෙන නමුත් මා ඇයට ගරු කරමි.

## ජයග්‍රහණය සඳහා දුවන්න!

අපට දෙවියන්වහන්සේ නියම කර තිබෙන්නාවූ දිවීම නිසි දාවන පථය තුළ දුවමු. සමහර අයට කෙටි දුරක් දිවීමට සිදුවන අතර තවත් අයට දිගු දුරක්

3 වෙනි පිටුවට ...




Echo of His Call

Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!


English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

* Please Subscribe and Share *

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)



## from your dearly beloved brother...

REACHING NATIONS



### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
HON. MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858
95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

**"සැබවින්ම නුඹට බොහෝ සෙයින් ආශිර්වාද කරන්නෙමි, බොහෝ සෙයින් නුඹ වර්ධනය කරන්නෙමි." (හෙබ්‍රෙව් 6:14)**

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රේමවන්තයෙනි,**

2025 වන නව වර්ෂයට පා තබා සිටින්නා වූ අපි දෙවි පියාණන් වහන්සේට සියලු ගෞරවය හා මහිමය පුද කරමු. එසේම උන්වහන්සේගේ අනර්ඝ කරුණාව නිසාත් උන්වහන්සේගේ විශ්වාසවන්තකම නිසාත් ස්වාමීන් වහන්සේගේ ශුද්ධ වූ නාමයට ප්‍රශංසා කරමු. මෙම පණිවිඩය කියන්නා වූ ඔබ සැම දෙනාම ඉතා හොඳ සෞඛ්‍ය තත්ත්වයකිනුත් බලවත් ඇදහිල්ලෙනුත් සිටිනවා ඇතැයි කියා මා විශ්වාස කරමි. ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට කළා වූ සැම ආශිර්වාද නිසාත් අප නිතරම උන්වහන්සේට ගුණවන්තව සිටිමු. අද උදැසන මා ඔබව ආත්මිකවත් ශාරීරිකවත් ආර්ථික ලෙසත් ආශිර්වාද ලබන්න ඕනෑය කියා මා යාඥා කළෙමි.

දෙවියන්වහන්සේ දුන්නා වූ කෙටි පණිවිඩයක් ඔබට මෙනෙහි කිරීම සඳහා මා ඔබ සමග බෙදා ගැනීමට කැමැත්තෙමි;

දෙවියන් වහන්සේගේ හික්මවීම දඬුවම් කිරීමක් නොවේ.

දෙවියන් වහන්සේගේ නිදහස් කිරීම අපගේ ජීවිතය තුළ දිගටම අප අත්දකින විටදී සමහර අවස්ථාවන්වලදී අපට කිසියම් උඩගු කමක් ඇතිවීමට පුළුවනි. මන්ද ස්වාමීන් වහන්සේගේ ප්‍රේමය කරණ කොට ගෙන දෙවියන්වහන්සේ සැම දේම අපගේ යහපත පිණිස කරන නිසා අප උන්වහන්සේට ගුණවන්ත නොවී ජීවත්වීමට පුළුවනි. දෙවියන්වහන්සේ ද අපට තරවටු කරමින් අපව හරිගස්වමින් අපට මග පෙන්වීමට බලා සිටි.

තරවටු කිරී මෙන් පමණක් අප තුළ වෙනසක් ඇති නොකරයි. දෙවියන් වහන්සේ අපව යම් යම් පීඩා තුළින් ගෙන ගොස් අපව යටහත් කර ස්වාමීන්වහන්සේ වෙතට ළං කර ගනී. මෙවැනි පීඩාවන් ගැන ගීතාවලිය 119:75 හි සඳහන් කරන්නේ එනම්; දෙවියන්වහන්සේ අපව පීඩා තුළින් ගෙන යන්නේ දඬුවමක් පිණිස නොවන අතර උන්වහන්සේ අපට දක්වන්නා වූ ප්‍රේමය කරන කොටගෙන අපව නිසි ලෙස හැඩගැස්වීම සඳහා එවැනි අත්දැකීම් තුළින් උන්වහන්සේ අපව ගෙනයනු ඇත.

දෙවියන්වහන්සේගේ ගුණාංග නම් ප්‍රේමය සහ විශ්වාසවන්තකමයි. උන්වහන්සේගේ විශ්වාසවන්තකම කිසිදාක වෙනස් නොවන්නේය. මනුෂ්‍යයන් මෙන් උන්වහන්සේ බොරු නොකරයි. උන්වහන්සේගේ ප්‍රේමය නිසා උන්වහන්සේ අපට දඬුවම් නොදී හික්මවීමකට පත්කරයි. අපව හික්මවීමකට පත් කිරීම දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ක්‍රියාවකි.

උන්වහන්සේ මෙසේ කරනු ලබන්නේ, උන්වහන්සේගේ දරුවන්ව සම්පූර්ණත්වයට ගෙනෙන පිණිසය. උන්වහන්සේගේ දරුවන්ව උන්වහන්සේගේ කෝපයෙන් පීඩාවට පත් නොකරයි. නමුත් අප උන්වහන්සේ තුළ වර්ධනය වෙමින් දියුණුව කරා ගෙනයන පිණිස උන්වහන්සේ අපට මේ දේ කරන බව අපගේ මුළු හදවතින්ම අප තේරුම්ගෙන නිවැරදි ආකල්පයක් ඇතිව උන්වහන්සේ තුළ ජීවත් විය යුතුයි. සිටිය යුතුයි. උන්වහන්සේ තුළින් පැමිණෙන පීඩාව හරි ආත්මයක් ඇතිව අප පිළිගත් විටදී යෝසෙප්ගේ ජීවිතයෙහි මෙන් අපගේ ජීවිතයෙහිත් දෙවියන් වහන්සේගේ ආශිර්වාද ලබාගත හැකිය. (උත්පත්ති 50:15-21)

***"ස්වාමීනි ඔබගේ විනිශ්චයන් ධර්මිෂ්ඨ බවත් විශ්වාස කමින් ඔබ මට පීඩා කළ බවත් දනිමි." (ගීතාවලිය 119:75)***

**යෙසුස කුසතුසවහනසෙ තුල ඔබගෙ සෙවක**

*Pr. Alex Samson Sam*

*Pr. S. Sam Selva Raj*

(+91) 98412 71858 / 98410 71858, E.mail : sam@echoofhiscall.org

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

## For Your Kind Attention!

Our 5 minute **Echo of His Call** YouTube messages are being broadcasted from 2.00 A.M. in Tamil, Telugu, English and Hindi (everyday). You can receive the Grace of God by watching the messages.

Moreover, save my mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (personal) in your mobile phones.

- Pr. S. Sam Selva Raj

*1 පිටුවෙන්....*

දිවීමට සිදුවෙයි. සෑම කෙනාටම මේ දිවීම දිවීමට හැකියාවක් සහ විනයක් තිබිය යුතුයි. අපට තව කෙනෙකුගේ දිවීම දිවිය නොහැකියි. නමුත් දෙවියන්වහන්සේ අපට තබා තිබෙන දිවීම පමණක් දුවමු.

සාමාන්‍යයෙන් කෙටි දුර ධාවනය කරන දාවකයෙකුට දිගු දුරක් එම ආකාරයෙන්ම දිවීමට නොහැකිය. ඒ ආකාරයට එක් එක්කෙනාගේ දිවීමට එක් එක් කොන්දේසි හා නීතිමාලාවක් තිබේ. එබැවින් අප ඉදිරියේ දෙවියන් වහන්සේ තබා තිබෙන්නාවූ දිවීම කෙළවර කිරීමට ස්වාමීන්වහන්සේගේ කරුණාව අපට ලැබී තිබේ.

එබැවින් අපට තබා තිබෙන දිවීම ඉතා උනන්දුවෙන් අන් අය දෙස නොබලා දෙවියන් වහන්සේගේ සැලැස්ම ඉෂ්ට කරන පිණිස දුවමු.

සමහර විට අපට දී තිබෙන දිවීම අප දුවන්නේ නැතිව ඉතා ලෙහෙසි පහසු ජනප්‍රියදේ තෝරාගෙන දිවීම කළහොත් අපට අපගේ දිවීම ජයග්‍රහණය කිරීමට නොහැකිය. මන්ද ජයග්‍රහණය ලැබීමට නම් දෙවියන්වහන්සේ නියම කළා වූ ධාවන පථය තුළ දුවමින් උන්වහන්සේ පොරොන්දු වූ ත්‍යාගය අපි අත්පත් කරගත යුතුයි.

අප තවත් කෙනෙකුගේ ධාවන පථයෙහි දිව්හොත් අපි පළවෙනියා වී එම තරගයේ ජයග්‍රාහකයා වුවත් අපගේ ත්‍යාගය අපට අහිමිවෙයි. ඒ නිසා දේව වචනය මෙසේ පවසයි.

***"දුවන ස්ථානයෙහි සියල්ලන්ම දුවන නමුත් තෑග්ග ලබන්නේ එක්කෙනෙක්ම බව නොදනිවුද? එසේම නුඹලාත් ලබා ගන්නා පිණිසදුවපල්ලා." (1 කොරින්ති 9:24)***



## අප දුවන්නේ කෙසේද?

## විශ්වාසවන්තව දුවන්න!

***"මම යහපත් යුද්ධයෙහි යුද්ධකළෙමි, මම දිවීම කෙළවර කළෙමි." (2 තිමෝති 4:7)***

අපට දිනුම ලබා ගන්න අවශ්‍ය නම් අප විශ්වාසවන්තව දිවිය යුතුයි. අපගේ ජීවිතයේ සෑම අංශයක්ම එනම්; අපගේ රැකියාව, විවාහය, ආර්ථිකය, සම්බන්ධතාවයන් සහ ආත්මික ගමනේදී අපි විශ්වාසවන්තව සිටිය යුතුයි.

අපට දෙවියන් වහන්සේ නියම කර තිබෙන දිවීම නම් සටන්කාමී දිවීමකි. ශුද්ධ වූ පාවුලු තුමා පවසන ආකාරයට "මම යහපත් සටනක සටන් කෙළෙමි". එනම් අපගේ මෙම ආත්මික දිවීමේ අපගේ සටන තිබෙන්නේ මේ ලෝකේ අධිපතියා සමඟයි. මේ ලෝකයේ අධිපතියා අපගේ ජීවිතය තුළ තිබෙන දෙවියන්වහන්සේගේ සැලැස්ම විනාශ කිරීමට උත්සාහ කරයි. එනම් ඔහුගේ ක්‍රියාව නම්; ***"සොරා එන්නේ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශ කරන්ටත් පමණක්ය...." (යොහාන් 10:10)*** අපගේ මැවුම්කාර දෙවියන්වහන්සේ අපගේ විශ්වාසවන්තකම ඒදන් උයනේදී සෝදිසි කලාක් මෙන් සෝදිසි කරයි.

එනම් යක්ෂයා සර්පයා විලසින් පැමිණ දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම පරීක්ෂා කළේය. ඔහු ඒවගේ මනසට සැකයක් දැම්මේය. එවිට ඇය උන්වහන්සේගේ අණපනත් හා වචනය සැක කළාය. අවසානයේදී ඇගේ ඇදහිල්ල නැති විය.

***"සර්පයා ද නුඹලා ඇත්තටම නසින්නේ නැත: මක්නිසාද නුඹලා එයින් කන දවසෙහි නුඹලාගේ ඇස් ඇරෙන බවත් නුඹලා යහපත හා නපුර දැනගෙන දෙවියන්වහන්සේට සමාන වන බවත් දෙවියන්වහන්සේ දන්නා සේකැයි ස්ත්‍රීට කීය." (උත්පත්ති 3:4-5)***

මෙම වංචා කිරීම තුලින් ආදම් සහ ඒව දෙවියන් වහන්සේ සමඟ තබා තිබූ එම අලංකාර සම්බන්ධතාවය විනාශ කර දැමුවේය.

දෙවියන්වහන්සේ අපට විශ්වාසවන්තව සිටින්න කියා පවසන්නේ උන්වහන්සේ අපට විශ්වාසවන්තව සිටින නිසාය. හෙබ්‍රෙව් 10:23 හි දෙවියන් වහන්සේ අපට මෙසේ පවසයි;

***"අපේ බලාපොරොත්තුවේ ප්‍රකාශ කිරීම චංචල නොවන පිණිස එය තදින් අල්ලාගෙන සිටිමු; මක්නිසාද පොරොන්දුව දුන් තැනැන් වහන්සේ විශ්වාසව සිටින සේක."***

දෙවියන්වහන්සේ පොරොන්දු දුන් විට උන්වහන්සේ එය ඉෂ්ටද කරයි. වසර ගණනාවක් ඔබගේ යාඥාවන් වලට පිළිතුරු නොමැති වුවත් ඔබව උන්වහන්සේ අමතක නොකරන බව විශ්වාස කරන්න. අපගේ සියලු කඳුළු උන්වහන්සේගේ භාජනයෙහි තබා තිබේ. ගීතාවලිය 56:8 උන්වහන්සේ නිතරම උන්වහන්සේගේ සෙනඟට පිළිතුරු දෙන පිණිස විශ්වාසවන්තව සිටින සේක.

එමනිසා ඔබගේ දිවීම නොකඩවා විශ්වාසවන්තව දුවන්න. උන්වහන්සේ අපට විශ්වාසවන්තව සිටිසි. උන්වහන්සේ අපට පවසන්නේ;

***"නුඹ විඳින්ට යන දේවලට බය නොවන්න බලව, නුඹලා විමසනු ලබන පිණිස යක්ෂයා නුඹලාගෙන් සමහර දෙනෙකුන් හිරගෙයි දමන්ට***

***යන්නේය. නුඹලා දස දවසක් පීඩා විඳින්නහුය. මරණය දක්වා විශ්වාසව සිටිපන්න, එවිට මම ජීවනයේ ඔටුන්න නුඹට දෙන්නෙමි." (එළිදරව් 2;10)***

අප දුවන්නා වූ දිවීම ඉතා ලේසි පහසු දෙයක් නොවේය. බොහෝ බාධා හා කරදර මැදින් අප දිවිය යුතුය. එහෙත් මෙම සෑම බාධා තුළින් අපි විශ්වාසවන්තව දුවන පිණිස උන්වහන්සේ බලාපොරොත්තු වෙයි.

අපට ඇතිවෙන්නා වූ සියලු බාධා, ප්‍රශ්න හා සියලු අභියෝගයන්ද සියලුම ශාරීරික මානසික පීඩාවන් ආත්මික සහ ආර්ථික ප්‍රශ්න මැදින් විශ්වාසවන්තව දිව්වහොත් අපගේ ඇදහිල්ල රක්ෂා කර ගතහොත් ජයග්‍රහණයේ ඔටුන්න අපට ලැබෙයි. අපගේ දිවීම අපට අතරමග නතර කිරීමට නොහැකිය. ආපසු හැරී බැලීමටද නොහැකිය. අපගේ හදවත තුළ තිබෙන ඇදහිල්ල කරණකොට ගෙන මෙම දිවීම දිවිය යුතුයි.

අපගේ ප්‍රස්ථාවන් කුමක් වුවත් අපගේ කැඳවීමේ විශ්වාසවන්තකම ඉතා වැදගත්ය. අපව විශ්වාස කර දෙවියන් වහන්සේ අපට දී තිබෙන වගකීම කුඩා වුවත් මහත් වූවත් අප එයට විශ්වාසවන්තව සිටිය යුතුයි. කිසිවෙක් ඔබ ගැන නොබලා ඔබව නොසලකා සිටින්නට පුළුවන. නමුත් දෙවියන් වහන්සේ ඔබ ගැන බලා සිටින බැවින් ඔබගේ ක්‍රියාවන් විශ්වාසවන්තව කරන්න.

**දේව වචනය මෙසේ පවසයි;**

***''තමාගේ වැඩෙහි දක්ෂ වූ මනුෂ්‍යයෙකු දකින්නෙහිද ඔහු පහත් අය ඉදිරියෙහි නොව රජුන් ඉදිරි යෙහි සිටින්නේය." (හිතෝපදේශ 22:29)***

ඔබ රැකියාව කරන්නා වූ ස්ථානයෙහි ඔබව කිසිවෙක් අගය නොකරන්නට පුළුවනි. සමහර විට ඔබගේ පවුලේ අය මිත්‍රයින් පවා ඔබව නොසලකා හරින්නට පුළුවනි. ඔබව පිළිනොගන්නට පුළුවනි. එහෙත් ඔබ විශ්වාසවන්තව සිටින්න. සමහර අවස්ථාවන්වලදී ඔබ යන සභාවේ ඔබට ප්‍රශ්න හා කරදර තිබෙන්නට පුළුවනි.

එහෙත් ඔබ විශ්වාසවන්තව සිටින්න. මන්ද අපට ප්‍රතිඵලය ලබා දෙන්නේ දෙවියන්වහන්සේය. ඔබ උන්වහන්සේට රහසිගතව කරන්නාවූ එම සේවාවලටම උන්වහන්සේ එළිමහනේ දී ඔබට ප්‍රතිඵල ලබා දෙනවා ඇත. දවසක් පැමිණෙනු ඇත. එම දවසේදී දෙවියන් වහන්සේ ඔබ දෙස බලා මෙසේ පවසයි.

***''ඔහුගේ ස්වාමියා ඔහුට කතාකොට යහපත් වූ විශ්වාස වූ දාසය ඒ යහපත ස්වල්ප දේ ගැන නුඹ විශ්වාස වූවෙහිය බොහෝ දේ කෙරෙහි නුඹ අධිපති කරමි. නුඹේ ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල් වෙන්නයි ඔහුට කීවේය." (මතෙව් 25:21)***

ඔබගේ ඇදහිල්ල තුළ විශ්වාසවන්තව සිටීමට දෙවියන් වහන්සේ ඔබට ශක්තිය හා ධෛර්යය දෙන සේක. අපට ඇතිවෙන්නා වූ සියලුරුම අභියෝගවලින් නොසැලී සිටීමටත් ස්ථිරව සිටීමටත් ක්‍රිස්තුස් වහන්සේගේ තානාපතියෝව සිටීමටත් උන්වහන්සේ ඔබට බලය දෙන සේක.

## (2). ඉවසීමෙන් දුවමු

***''.....ඇදහිල්ලේ කතෘවරයාද සම්පූර්ණ කරන්නා ද වූ යේසුස් වහන්සේ දෙසම බලමින් අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු" (හෙබ්‍රෙව් 12:1)***

සෑම ධාවකයෙකුටම තිබිය යුතු සුදුසුකම නම් ඉවසීම සහ උත්සාහයයි. ගමන අමාරුවන විට ඒ ගමන අපට අත්හැරීමට නොහැකිය. සාර්ථකත්වය අවශ්‍ය නම් කැපවීම සහ විනය, කැමැත්ත සහ අපට තිබෙන පහසුකම් අතහැර ඊට එහා ගියා වූ අපගේ ඉලක්කය කරා යා යුතුයි. ඒ දෙය සිදුවීමට නම් අපි ඉතා අමාරුවෙන් සහ මහන්සියෙන් වේදනාව දරාගෙන ක්‍රියා කළ යුතුය.

අපගේ කිතුණු ගමන පහසු දෙයක් නොවේය. අප බොහෝ අභියෝගවලට, ප්‍රශ්නවලට හා සටන්වලට අපගේ ඇදහිල්ල නිසා මුහුණ දීමට සිදුවෙයි. සමහර අවස්ථාවලදී අපව අනික් අය තේරුම් ගන්නේ නැත කියා අපි තනිවෙමු. එහෙත් අපි ඉවසීමෙන් සෑම දේම දරාගෙන අපගේ උත්සාහය අත් නෑර ලෝකයේ වටින්නාවූ දේට වඩා දෙවියන් වහන්සේගේ දේ වටිනා බව තේරුම් ගෙන අපගේ දිවීම අපි දිවිය යුතුය.

අපගේ මාර්ගය පටු සහ අභියෝගවලින් පිරී තිබුණත් අප එක දෙයක් මතක තබා ගත යුතුය. අවසානයේදී අපට මහත් ප්‍රීතියක් තිබෙන බවත් අපි ගන්නා වූ සෑම පියවරකදීම දෙවියන් වහන්සේ අපහා සමඟ සිටින බවත්ය.

එළියාගේ ජීවිතය දෙස බලන විටදී ඔහු පැවසුවේ; ***''මා පමණක් තනිවී සිටිමි."*** කියාය. *1 රාජාවලිය 19:10* දාවිත්ටද ඔහුගේ ජීවිතයේ තනිකම පාළුව දැනුණි. මෝසෙස්ට ද මේ අත්දැකීම් තුළින් ගමන් කිරීමට සිදුවිය. එම නිසා මෙවැනි තනිකමේ හැඟීම් අපට අලුත් දෙයක්

*....Contd. to page 6*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**පෙබ:19-** අපගේ මාධ්‍ය සේවය තුළින් හා කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ යූටියුබ් නාලිකාව හරහා ළඟා නොවූ ජනතාව වෙතට ළඟා වීමට හැකි වූ නිසා ස්තුති කරන්න.

**පෙබ:20-** අපගේ සභා සේවයේ වැඩ කටයුතු ඉතා සංවිධානාත්මකව කිරීමට හැකිවීම නිසා ස්තුති කරන්න.

**පෙබ:21 -** අපගේ නෙහෙමියා බයිබල් විද්‍යාලයේ සහ ශාන්ත පාවුල් මෙට්ට්‍රිකියුලේෂන් පාසලේ සිසුන්ට ලබා දුන් දිව්‍යමය රැකවරණය නිසා ස්තුති කරන්න

**පෙබ:22-** අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ හවුල්කරුවන්ගේ මූල්‍යමය අවශ්‍යතා හා අනෙකුත් සියලු අවශ්‍යතාවලට ආශිර්වාද සපයා දුන් නිසා ස්තුති කරන්න.

**පෙබ:23 -** අපගේ සේවයට දායකත්වය දක්වන්නා වූ යාඥා හවුල්කරුවන් දායකත්ව හවුල්කරුවන් හා ජීවිත කාලය පුරාම දායකත්වය දරන හවුල්කරුවන්ට හා ඔවුන්ගේ පවුල්වලට කළ ආශිර්වාද නිසා ස්තුති කරන්න.

**පෙබ:24-** අපගේ ප්‍රධාන පාලකතුමා විවිධ සේවාවන් හරහා ශුභාරංචිය ප්‍රකාශ කිරීමට දැක්වූ කැපවීම නිසා ස්තුති කරන්න.

**පෙබ:25-** අපගේ සභාවේ සියලුම ක්‍රියාකාරකම්වලට උද්යෝගයෙන් සහභාගී වීමට තරුණයින්ට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**පෙබ:26-** අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ සහකාර සංස්කාරක තුමාට සහ ඔහුගේ පවුලට කළ ආශිර්වාද නිසා ස්තුති කරන්න.

**පෙබ:27-** අපගේ ප්‍රධාන දේවගැති තුමා වන එස්. සැම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ සියලුම දෙනා දුෂ්ට බල වේගවලින් ආරක්ෂා කළ නිසා ස්තුති කරන්න

**පෙබ:28-** අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල ඉරුදින දේව මෙහෙයන් තුළ දෙවියන් වහන්සේගේ වචනයේ බලය ක්‍රියාත්මක වූ නිසා ස්තුති කරන්න

**මාර්:01-** අපගේ ශාන්ත පාවුල් මෙට්ට්‍රිකියුලේෂන් පාසලේ විදුහල්පතිතුමා, ගුරු මණ්ඩලය හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**මාර්:02-** උන්වහන්සේගේ ආශිර්වාදයේ වරුෂාව අපගේ සේවකයින්ට ලැබී තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:03-** අපගේ ප්‍රධාන දේව සභාවේ සුභාරංචි සේවයේ යෙදෙන සාමාජිකයින්ට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**මාර්:04-** ඊශ්‍රායලය, පලස්තීනය, රුසියාව හා යුක්‍රේන් යන රටවලට සමාදානය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:05-** සියලුම ජාතීන්ගේ සමගිය හා සමාදානය පිණිස, යාච්ඤා කරන්න.

**මාර්:06-** කිතුණු දේශකයින් කාමමිථ්‍යාචාරයෙන් තොරව සුභාරංචිය පරිපූර්ණ ලෙස දේශනා කරන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:07:** 2025 - 2026 අධ්‍යයන වර්ෂ සඳහා අපගේ නේවාසික සහ සන්ධ්‍යා කාලයේ නෙහෙමියා බයිබල් විද්‍යාලය සඳහා සුදුසුකම් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස යාච්ඤා කරන්න

**මාර්:08-** අපගේ ශාන්ත පාවුල් මෙට්ට්‍රිකියුලේෂන් පාසලට 2025 සිට 2026 අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස යාච්ඤා කරන්න.

**මාර්:09-** නොයෙකුත් ජාතීන්ට අයත් දරුවන් හා තරුණයින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ඔවුන්ගේ පුද්ගලික ගැලවුම්කරුවාණන් ලෙස පිළිගන්නා පිණිස යාච්ඤා කරන්න.

**මාර්:10-** ජංගම දුරකථන සහ ONLINE ක්‍රීඩාවලට ඇබ්බැහිවීමෙන් ලෝක ළමුන් හා තරුණයින් ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:11-** වැඩිහිටි නිවාසවල සිටින වියපත් පුද්ගලයින් නිසා යාච්ඤා කරන්න.

**මාර්:12-** මෙම මාසය තුළදී අපගේ සියලු අවශ්‍යතාවයන් දෙවියන් වහන්සේ සපයන්න කියා යාච්ඤා කරන්න.

**මාර්:13-** ඊශ්‍රායලය, පලස්තීනය, රුසියාව හා යුක්රේණය යන රට වලට සාමය ලැබෙන පිණිස අපගේ හවුල්කරුවන් සහ රාජ්‍ය සම්බන්ධීකාරකවරුන් ට යහපත් සෞඛ්‍යය තත්ත්වයක් ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:14-** ඉන්දියාව තුළ ළඟා නොවූ ස්ථාන වලට සුභාරංචිය පැතිරවීමට අපට හැකියාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:15-** 2025 වන මෙම නව වසර තුළදී දෙවියන් වහන්සේගේ දයාව බහුලව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:16-** අපගේ කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ හා මුද්‍රණාලයේ සේවය කරන්නා වූ සියලු දෙනාට යහපත් සෞඛ්‍යයක් ලබා දෙන පිණිස අපගේ ප්‍රධාන සභා පාලකතුමා වන එස්. සැම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ සාමාජිකයින්ව සියළු ආකාර දුෂ්ට බලවේගයන්ගෙන් ආරක්ෂා කරදෙන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:17-** ලෝකයේ තුළ සිටින්නා වූ සියලුම කාන්තාවන් හා දරුවන්ගේ ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**මාර්:18-** අපගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් ඉතා හොඳ සෞඛ්‍ය තත්ත්වයකින් තබන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

නොවේය. ***''එබැවින් මෙපමණ මහත් සාක්ෂිකාර සේනාවකින් අප වටව සිටින නිසා සියලු බරද පහසුවෙන්ම අප අසු කරන පාපයද අහක දමා......" (හෙබ්‍රෙව් 12:1)***

අපට ඉදිරියෙන් ධාවනය කළ අයගේ දිවීම දෙස බලන විට අපගේ දිවීම අත්හැරිය නොහැකිය. සමහර විට අපට මෙම ගමන වෙහෙස මහත්සි විය හැක. නමුත් අපගේ උත්සාහය අත් නොහැරිය යුතුයි. අපිට විරුද්ධව බොරු චෝදනා, වැරදි වැටහීම් හා අධෛර්යයට පත් කරන වචන පැමිණෙන විට අප අසන්නට පුළුවන් ප්‍රශ්නය නම් ''මා මෙම ගමන දිගටම යා යුත්තේ ඇයි?' කියාය''. මතක තබාගන්න; දෙවියන් වහන්සේ අපව කැඳවා තිබෙන්නේ උත්සාහය අත් නොහැර ඉදිරියටම යන පිණිසයි.

අප කිසිවෙක් තනිවීමට අකමැතිය. එහෙත් අපගේ හදවත අප රැක ගත යුතුයි.

***''...... එබැවින් කවරෙක් නමුත් ලෝකයට මිත්‍ර වෙන්ට කැමැත්තේ නම්, ඔහු දෙවියන්වහන්සේට සතුරෙක් වන්නේය." (යාකොබ් 4:4)*** අපගේ තනිකමේදී අප ලෝකයේ මිත්‍රකම් නොසොයා දෙවියන් වහන්සේ දෙස බලාගෙන ගමන් කරමු.

එබැවින් අපි චංචල නොවී අප ඉදිරියේ තිබෙන දිවීම අපි ස්ථිර ලෙස ඉවසීමෙන් දුවමු.

## (3). දිවීම අවසන් කරන්න!

අපගේ ඉලක්කය නම් දිවීම අවසන් කිරීම නොව එය ජයග්‍රාහීව අවසන් කිරීමයි. ක්‍රියා 20:24 හි මෙසේ පවසයි. ''නමුත් මාගේ දිවීමද දෙවියන් වහන්සේගේ කරුණාවේ සුභාරංචියට සාක්ෂි දෙන පිණිස ස්වාමි වූ යේසුස් වහන්සේගෙන් මට ලැබුණු මෙහෙයද සම්පූර්ණ කිරීම පමණ මාගේ ජීවිතය වැදගත්ය නොහොත් මටම අගයේ කියා මම කිසිසේත් නොසලකමි."

ප්‍රිය මිත්‍රවරුනි, අපගේ ජීවිතය යේසුස් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා කළ දේ පමණක් සදහටම පවතී. අප මෙම නව වසරේ ආරම්භයේදී අප ඉදිරියෙහි තබා තිබෙන ඉලක්කය කරා අප දුවනවාද? අප නියම දාවන පථය තුළ දුවනවාද? ඔබට පැමිණෙන සෑම බාධාවක්ම ජයග්‍රහණය කරගෙන ඉතාමත්ම උනන්දුවෙන් හා ඉවසීමෙන් ඔබ සන්තක සියලු දේම මෙම දිවීදිවීම උදෙසා කැප කොට දුවනවාද? ඔබ කිසියම් ආකාරයකින් මෙම දිවීමෙන් පසුබට වී, එම දිවීම අතපසු කර තිබෙනවාද? එසේනම් ඔබ නැවත හැරෙන පිණිස ඔබට මෙය කදිම අවස්ථාවයි.

අප ඉතා විශ්වාසවන්ත ලෙස මෙම දිවීම දුවමු. එනම් ඉතා උනන්දුවෙන්ම දිවීම කෙළවර කරන පිණිස ශක්තිමත්ව දුවමු. මෙම දිවීම අතහරින්න එපා! ස්වාමීන් වහන්සේ විශ්වාසවන්තයි.

උන්වහන්සේ කිසිවිටෙක උන්වහන්සේගේ කරුණාව අපගෙන් පහ කරන්නේ නැත. දරා ගැනීමට නොහැකි බරක් ඔබ උසුලාගෙන යනවාය කියා සිතනවාද? එසේ නැතිනම් ඔබ මානසික ලෙස වැටී සිටිනවාද? එසේඑසේනම් ඔබ දැන්ම දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය වෙතට පැමිණ, ඔබගේ හදවත වගුරුවා ස්වාමීන් වහන්සේට මෙසේ පවසන්න; ''ස්වාමීනි, මගේ ජීවිතයේ මෙවැනි ස්ථානවල ප්‍රශ්න තිබෙනවා. එම නිසා මට මෙම දිවීම දුවන්න අමාරුයි. මගේ බර ඉතා බරයි. එය තවදුරටත් මට දරා ගැනීමට අසීරුයි. මට උපකාර කරන්න." කියා පවසන්න.

හෙසකියා රජතුමාගේ උදාහරණය දෙස බලමු; ඔහු අසිරිය රජතුමාගේ වචනය ඇසූ විට ඔහුගේ හදවත කඩා වැටුණේය. එවිට ඔහුට කිසි කෙනෙකුගේ උපකාරය නැතැයි කියා ඔහු සිතුවේය.

අසිරිය රජතුමා ඔහුට ඔච්චම් කළේය. ඔහුගේ ඇදහිල්ල සුළු කරනු ලැබීය. මා ඉදිරියේ සටන් කිරීමට ඔබට පුළුවන්ද? මා ඉදිරියේ ඔබට තිබෙන බලාපොරොත්තුව කුමක්ද? මගේ අතින් ඔබව බේරාගන්නේ කවුද? කිසිවෙක් මාගේ අතින් උඹව මුදවා ගැනීමට නොහැකියි. ඔබට අවශ්‍ය නම් අශ්වයෝ දෙදහසක් දෙන්නම්. අසිරියට විරුද්ධව සටන් කිරීමට ඔබට පුළුවන්ද? කියා ඔච්චම් කළේය.

මෙය කුමන ආකාරයේ අපහාස කිරීමේ අභියෝගයක්ද? හෙසකියාගේ මනස මෙවැනි අවස්ථාවේදී කෙසේ තිබෙන්නට ඇත්ද? එහෙත් ඔහු දෙවියන්වහන්සේ වෙතට හැරුණි. ඔහුගේ බලය තිබෙන්නේ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය තුළය කියා ඔහු දැනගත්තේය.

මෙවැනි අවස්ථාවකදී ඔබ කුමක් කරන්නේද? අසිරිය රජතුමා ඉතා බලවත්ය කියා හෙසකියා දැනගත්තා. එම නිසා ඔහුගේ අනාගතය අඳුරුව තිබුණි. එබැවින් ඔහුගේ ඇදහිල්ල නැති කරමින් ඔහුගේ දිවීම ඔහුට නතර කිරීමට තිබුණි. යෙසායා 37 වන පරිච්ඡේදය දෙස බලන විටදී ඔහුගේ ප්‍රතිචාරය වෙනත් ආකාරයකින් තිබුණු බව අපට පෙනී යයි.

1. ඔහු දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයට හැරුණි. හෙසකියා දේව මාලිගාවට ගොස් දෙවියන් වහන්සේ ඉදිරියෙහි ඔහුව යටත් කළේය.

2. ඔහු ඔහුගේ ප්‍රශ්නය දෙවියන් වහන්සේ සමඟ බෙදාගත්තේය. ඔහුගේ හදවත දෙවියන් වහන්සේ ඉදිරියෙහි වගුරුවා දිව්‍යමය අනුග්‍රහය හා මග පෙන්වීම බලාපොරොත්තු වූයේය. දාවිත් මෙසේ ලියයි; ***''මාගේ***

***මාර්ග කියා දුනිමි. ඔබ මට උත්තර දුන් සේක. ඔබගේ පනත් මට ඉගැන්නුව මැනව..” (ගීතාවලිය 119:26)*** අපි අපගේ ප්‍රශ්නයන් දෙවියන් වහන්සේ ඉදිරියට ගෙනයාමට ධෛර්යවත් වෙමු. අපගේ වැටීම් අපගේ අධෛර්යකම් උන්වහන්සේට භාර දෙමු. අපි ඒ දේ කරන විට උන්වහන්සේ උන්වහන්සේගේ මාර්ගය අපට උගන්වනවා අපව ඉදිරියට ගෙනයයි.



## නොනවත්වා දුවමු!

ප්‍රිය සහෝදරයා සහෝදරිය ඔබගේ සේවයේදී ඔබ ක්ලාන්තභාවයට පත්වී සිටිනවාද? ඔබගේ උත්සාහයෙන් ඔබ ප්‍රශ්නවලට මුහුණ දෙනවද? අත් නොහරින්න! මෙයයි අවස්ථාව! නැවත නැගිට ඔබගේ දිවීම ආරම්භ කරන්න. ස්වාමීන් වහන්සේ පවසන තුරු දුවන්න. ඔබ මුහුණ දෙන අභියෝගයන් කුමක් වුවත් අප උත්සාහවන්තව දිවිය යුතුයි.



## නිශ්ඵලව නොදුවන්න!

ඔබගේ දිවීම ඔබ නිශ්ඵලව නොදුවන්න. පාවුලු තුමා ගලාති 2:2 හී මෙසේ ලියනු ලබයි; *“..... නුමුත් මා දුවන්නා වූ නොහොත් දිව්වා වූ දිවීම යම් හෙයකින් නිෂ්ඵල නොවන පිණිස....”*

අප ඉතාම අවධානයෙන් දෙවියන්වහන්සේව අප ඉදිරියෙහි තබා තිබෙන්නා වූ දිවීම දිවිය යුතුයි. අපගේ වෙහෙස මහන්සිය නිශ්ඵල නොවන පිණිස ඒබ්‍රහම්ගේ ජීවිතයෙන් අපි පාඩමක් ඉගෙන ගනිමු. ඇ එම තරගයේ පළමුවෙනියා වී ජයග්‍රහණය ලබා දිනුම කරා පැමිණුනත් ඇයට ලැබිය යුතු පදක්කම නොලැබුණේ ඇගේ කුඩා වරදක් නිසාය.

සමහර අවස්ථාවන්වලදී අප වෙහෙස මහන්සියෙන් කැපවීමෙන් සහ විශ්වාසවන්තව වැඩ කරනු ලැබුවත් අප එම දිනුම ලබා ගැනීමට නුසුදුස්සයෙක් වෙනවා ඇත. මන්ද දෙවියන් වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන දේ අප නොසලකා දුවන නිසා උන්වහන්සේ අපට නියම කළා වූ දිවීම අපේ වරදවා තේරුම් ගෙන දුවන නිසාය.

අපි කාලයක් වෙන් කරගෙන උන්වහන්සේගේ කැමැත්ත කුමක්ද කියා සොයමු. උන්වහන්සේගේ අරමුණ හා පණිවිඩය කුමක්ද කියා සිතමු. අපි අපගේ අරමුණ කරා දුවමින් ජයග්‍රාහිකව අපගේ දිවීම නිමා කිරීමට හැකිවන්නේ එවිටය.

2 සාමුවෙල් 18 වන පරිච්ඡේදය කියවන විටදී අපිට පෙනී යන්නේ යෝවාබ් දාවිත්ගේ පුත්‍රයා වන අබ්සලෝම්ට විරුද්ධව සටන් කළ ආකාරයයි. දාවිත් ඔහුට පවසනු ලැබුවේ,

අබ්සලෝම්ට හානියක් නොවන ලෙස සටන් කරන්න කියාය. සටනේදී යෝවාබ් ජයගත්තේය. නමුත් අබ්සලෝම් මරා දමනු ලැබුවේය. මේ පණිවිඩය දාවිත්ට දීමට අවශ්‍යමුත් මෙය ඉතා සංවේදී දෙයක් නිසා මෙම පණිවිඩය ලබාදීමට ඉතා පරිස්සමෙන් දිවිය යුතුව තිබුණි.

මෙම පණිවිඩය දාවිත්ට ලබාදීමට දෙදෙනෙක් කැමති වූයේය. නමුත් එම පණිවිඩය අහිමයාශ්ට ගෙනයන්න එපා කියා යෝවාශ් පැවසීය. නමුත් ඔහු කුෂියයාව තෝරාගෙන එම පණිවිඩය දාවිත් රජතුමාට ගෙනයන්න කියා ඔහුට පවසනු ලැබීය. කුෂීයයා එම පණිවිඩය රජතුමාට පවසන පිණිස දුවන්න පටන් ගත්තේය. අහිමයාශ් ද යෝවාශ්ට මමත් දුවන්නම් කියා පවසමින් දුවන්නට පටන් ගත්තේය. අහිමයාශ් ට ඉතා වේගයෙන් දිවීමට හැකි නිසා ඔහු කුෂීයයාට පෙර දාවිත් ලඟට දිව ගියේය.

දාවිත් ඉතා ඕනෑ කමෙන් තමා වෙතට ගෙනෙන පණිවිඩය කුමක්ද කියා දැනගන්නා පිණිස බලා සිටියේය. ඔහු අහිමයාෂ්ගෙන් යුද්ධයේදී කුමක් සිදුවූවාද කියා අසනු ලැබීය.

නමුත් අහිමයාෂ් සම්පූර්ණ විස්තරය දන්නේ නැත කියා ***“.... යෝවාබ් විසින් රජ්ජුරුවන්ගේ මෙහෙකරුවාත් ඔබගේ මෙහෙකරු වූ මාත් එවන කොට මහත් කෝලාහලයක් දුටිමි. නුමුත් එය කිමෙක් දැයි නොදත්තෙමියි උත්තර දුන්නේය.” (2 සාමුවෙල්***

....Contd. to page 9

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Qualification : 10th Standard & above
Rush for admission! Medium :Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)
Diploma in Theology
Recognised by
International Christian Leaders &
Senior Pastors for the past 55 years
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## “...කියවන්නා තේරුම් ගනීවා....” (මතෙව් 24:15)

"නුඹට විරුද්ධව සාදන කිසිම ආයුධයක් සඵල නොවන්නේය; විනිශ්චය කිරීමට නුඹට විරුද්ධව නැගිටින සියලුම දිව් නුඹ විසින් වරදට පත් කරනවා ඇත..." (යෙසායා 54:17)

දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ වර්ධනය සඳහා අලුතින් සේවාවක් ආරම්භ කළ විටදී බොහෝ අවස්ථාවන්වලදී මහත් අමාරුකම් හා ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වෙයි. සමහර විට යක්ෂයාගෙන් අපට සෘජුවම කරදර සිදු වෙයි. සමහරවිට මනුෂ්‍යයන්ගෙන් කරදර පැමිණෙයි. මගේ සේවා කාලයේදී මා තනි පුද්ගලයෙක් හැටියට බොහෝ ප්‍රශ්න හා විරුද්ධකම්වලට මුහුණ දුන්නෙමි.

අපගේ ප්‍රධාන සේවා ගොඩනැගිල්ල සාදන විටදී ඒ අවට සිටි මනුෂ්‍යයෙන් ඒ ගැන එතරම් සතුටට පත්වුණේ නැත. ඔවුන් මට නානාප්‍රකාර කරදර කිරීමට පටන් ගත්තේය. ගොඩනැගිල්ලේ වැඩ කළ අයටද මේ අය බොහෝ කරදර කළ නිසා බොහෝ අය ගොඩනැගිල්ලේ වැඩ කිරීමට පැමිණුනේ නැත. එබැවින් මට වැඩ කිරීමට අලුත් අය සොයා ගැනීමට අසීරු විය. අපගේ ගොඩනැගිල්ලේ කොන්ත්‍රාත්තුව ගෙන සිටි කිතුනු කොන්ත්‍රාත්කරුවන් ද මේ ප්‍රශ්න වලට බය වී නොකියාම යන්නට ගියේය. මෙම ගොඩනැගිල්ල සෑදීමට විරුද්ධ වූ සමහර අය මා ළඟට පැමිණ ඉතා සුහදව කතා කර *"මේ ස්ථානයෙන් වෙනත් ස්ථානයකට ගොස් ගොඩනැගිල්ල සාදන්න, මෙහි ගොඩනැගිල්ල සාදන එක නතර කරන්න."* කියා පැවසීය. එසේම මෙම ගොඩනැගිල්ල සෑදීම නතර කිරීම නිසා සිදුවන අලාභයට මුදල් ගෙවීමටද ඔවුන් සූදානම් විය. මම ඉතා යටහත් පහත්ව "මෙය ජීවමාන වූ දෙවියන් වහන්සේගේ වැඩක්, උන්වහන්සේ මාව ඒ සඳහා කැඳවා තිබෙනවා. ඒ නිසා මට මෙතනින් යාමට අමාරුයි. එබැවින් මට හිරිහැර කරන්න එපා." කියා ඉතා ප්‍රේමයෙන් හා ඉතා යටහත් පහත්ව මම ඔවුන්ට පවසනු ලැබීය.

නමුත් ඔවුන් මෙසේ දිගටම මට ශාරීරිකවත් මානසිකවත් කරදර කිරීමට පටන් ගත්තේය. මෙම අවස්ථාවේදී මා එම නගරයේ සිටි කිතුනු නායකයින්ටත් කිතුණු නීතිඥවරුන් ටත් කතා කළෙමි.නමුත් කිසි කෙනෙක් මගේ උදව්වට ආවේ නැත. නමුත් මම දෙවියන් වහන්සේගේ පාමුලට ගොස් වැඩි වැඩියෙන් මේ සඳහා යාඥා කිරීමට පටන් ගත්තේය. එවිට මට මහත් සමාදානයක් ලැබුණේය. මා ඉතා ඇදහිල්ලෙන් නැවත වැඩ කිරීමට පටන් ගත්තෙමි.

මේ සඳහා මම ඔබට ඉතා කුඩා උදාහරණයක් ලෙස මෙය පවසමි; දිනක් අප මෙම ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් දමන පිණිස සූදානම් වී කොන්ක්‍රීට් මිශ්‍ර කළ වාහනයක් කොන්ත්‍රාත්කරුවන් විසින් එම ස්ථානයට රැගෙන ආවේය. නමුත් සියලුම අසල්වාසීන් එම වැඩ නතර කරන්නය කියා කෑ ගැසීය. එම අවස්ථාවේදී මා හට කිරීමට කිසි දෙයක් නොමැති වූ නිසා එවා තිබූ ආයතනයට අලාභ මුදල් සමඟ නැවත කොන්ක්‍රීට් ගෙන ආ රථය හරවා යැවීමට සිදුවිය. නමුත් දෙවියන් වහන්සේ නැවත දින කීපයකට පසුව එම වැඩ අවසන් කිරීමට උපකාර කළේය.

පසුව අප මෙම ගොඩනැගිල්ලේ වැඩ නිමා කළ පසු මා දන්නා වූ මිත්‍රයින්ටත් අන් අයටත් අපගේ මෙම ගොඩනැගිල්ල කැපකිරීමට ආරාධනා පත්‍ර යැව්වෙමු. මේ වනවිට අපට විරුද්ධව ක්‍රියා කළ සෑම කෙනාම කුමන හෝ හේතුවක් මත එම ස්ථානය හැර දමා ගොස් තිබුණි.

සමහරු තමන්ගේ පවුල් ප්‍රශ්න නිසාත් තවත් සමහරු ඔවුන්ගේ ඉඩකඩම් විකුණා දමා තිබූ නිසාත් ආදී විවිධ හේතු මත ඔවුන් සෑම කෙනෙක්ම එම ස්ථානයෙන් ඉවත්ව යාමට සිදුවී තිබුණි. අද දෙවියන් වහන්සේගේ කරුණාවෙන් අපි එම ගොඩනැගිල්ල කැපකිරීමේ දේව මෙහෙයද තැබුවෙමු. ඒ වන විට සමහර ගොඩනැගිලි කඩා වැටී කිසිවෙක් එහි වාසය කිරීමට නොහැකි තත්ත්වයක පැවතුණි. තවත් සමහර ගොඩනැගිලි වල කිසිවෙක් නොමැති නිසා ඒවා වසා දමා තිබුණි.

මේ වන විට අපගේ සේවයට විරුද්ධව කිසිදු අයෙක් නැත. එම පළාතේ තිබෙන විශාලතම ගොඩනැගිල්ල අපගේ ස්ථානය වන අතර බොහෝ සෙනගක් එම ස්ථානයට පැමිණ

දෙවියන්වහන්සේට නමස්කාර කරනු ලබති. රෑ දාවල් දේව රාජයේ කාරණා උදෙසා ද තවත් අය එම ස්ථානයෙහි ඉතා කාර්ය බහුලව වැඩ කරනු ලබති. දේව වචනයෙහි මෙසේ පවසයි;

*''නුඹට විරුද්ධව විරුද්ධව නැගිටින්නා වූ නුඹේ සතුරන් ස්වාමීන් වහන්සේ නුඹ ඉදිරියෙහි පරාජය වෙන්ට සලස්වන සේක ඔවුහු නුඹට විරුද්ධව එක මඟකින් අවුත් සත් මගෙකින් නුඹ ඉදිරියෙන් පලා යන්නෝය." (ද්විතීය කතාව 28:7) "නුඹ සමග විවාදයට සිටින මනුෂ්‍යයන් නුඹ සොයන නමුත් ඔවුන් සම්භවන්නේ නැත. නුඹට විරුද්ධව යුද්ධ කරන මනුෂ්‍යයෝ කිසිත් නැතිකමත් හිස්කමක් මෙන් වන්නෝය." (යෙසායා 41:12)*

ප්‍රිය මිත්‍රය, ඔබගේ ජීවිත තුළ හෝ සේවය තුළ බොහෝ අමාරුකම්, අභියෝග හා ප්‍රශ්න රාශියක් මැද සිටිමින් ඔබ ඒවාට තනියම මුහුණ දෙනවාද? ඉවසීමෙන් දෙවියන්වහන්සේගේ මුහුණ සොයන්න. ඔබගේ සෑම දේම ඔබට අහිමි වී තිබුණත් ඔබට සුභ අනාගතයක් දෙවියන් වහන්සේ තබා තිබෙන බව අමතක නොකරන්න.

************

*7 පිටුවෙන්....*

*18:29)* මෙසේ ඔහු ඉතා වේගයෙන් පෙරටුව දිව්වත් ඔහුට අර්ථවත් පණිවිඩයක් තිබුණේ නැත. නමුත් කූෂියයා සෙමෙන් දිව්වත් පණිවිඩකාරයෙකු හැටියට ඔහුගේ වගකීම ඔහු ඉටු කළේය.

දාවිත්ගේ ප්‍රශ්නයට කූෂියායාට ඉතා ඥානවන්තව පිළිතුරු දීමට හැකි විය. *''...මාගේ ස්වාමී වූ රජ්ජුරුවන්ගේ සතුරෝ ද ඔබට අන්තරාකරන්ට ඔබට විරුද්ධව නැගිටින සියල්ලෝද ඒ යවනයා මෙන් වෙත්වයි උත්තර දුන්නේය.'' (1 සාමුවෙල් 18:32)* කූෂියයා රජුට කෙලින්ම පණිවිඩය නොපවසා


## Echo of His Call Postal Courses for candidates in India only

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.
Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

## Pray for IMMEDIATE REQUIREMENT


**ECHO OF HIS CALL is expanding at a fast pace. We need mission minded, dedicated and faithful men and women candidates for the following positions:**

- Full time Assistant Pastors for our Main Church
- Full time Assistant Pastors for our Branch Churches in Chennai
- Full time security personnel
- DTP Operators and Typists
- Candidates with proficiency in speaking and writing English and other languages
- Managers and Co-ordinateors interested in School & Office Administration
- Full time Bible College Lecturers
- Volunteers who can promote our ministry in cities & villages
- Hon. Co-ordinators to serve in Editorial Board of **Echo of His Call**
- Full time Drivers
- Principal and Teachers for Matriculation School
- Full time female cooks
- Full time housekeeping employees

**Salary based on qualification and experience.**

Please Contact **ECHO OF HIS CALL** office
**Apply at Whatsapp No : 98412 71858**
**Email : sam@echoofhiscall.org**

RNI NO. TN/SIH/2006/17846



*The Cushite tactfully informed David of Absalom's death.*

අබ්සලොම් මැරුණ බව ඉතා ඥානවන්ත ලෙස පවසනු ලැබීය. අහිමයාශ්ටත් කුශියයාටත් තිබූ වෙනස මෙයයි. ඔහුට හොඳින් දුවන්න පුළුවන් වුවත් ඔහු ඉතා දුර්වල පණිවිඩකාරයෙකි. මන්ද පණිවිඩකාරයාගේ වගකීම නම් තමාට දුන් පණිවිඩය නිවැරදි ආකාරයෙන් පැවසීමයි.

අපි අහිමයාෂ්ගේ කතන්දරයෙන් පාඩමක් ඉගෙන ගනිමු. ඔහු වාගේ අපි නොදිවිය යුතුයි.

ප්‍රිය සහෝදරයා සහෝදරිය අපි මේ වසරේ නිෂ්ඵල ලෙස නොදුවා අපිට දී තිබෙන්නාවූ අරමුණ කුමක්ද කියා පැහැදිලිව දැනගෙන ජයග්‍රහණය ලබන පිණිස ස්වාමීන් වහන්සේ දෙස බලාගෙන ඉවසීමෙන් දුවමු.

************

## Echo of His Call

**YouTube**

Please subscribe

Kindly view and subscribe our Echo of His Call YouTube Channel when you get time. Thanks.

**- Editor**

# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS / 1 Patrika Channel"**

**on 3rd FEBRUARY 2025.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

**P.O. Box No. 2957,**

**Chepauk, Chennai - 600 005, INDIA.**

**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**